රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
ජනමාධ්‍ය පර්යේෂණ අංශය
ලිපිනය : 163, කිරුළපන මාවත, කොළඹ 05 | දුරකථන : +94 112 512 749 | විද්‍යුත් තැපැල් : govinformediaresearch@gmail.com

ප්‍රධාන කර්තෘ/ ප්‍රවෘත්ති කර්තෘ
අධ්‍යක්ෂ(ප්‍රවෘත්ති)/ ප්‍රවෘත්ති කළමනාකරු

ප්‍රවෘත්ති නිවේදනය

සිනමාව සමාජ විද්‍යාත්මකව කියවීම.....

අරුන් කුමාර් අධ්‍යක්ෂණය කළ Chithha

පොලිස් හා ත්‍රිවිධ හමුදා නිලධාරීන් ගේ චිත්ත ධෛර්යය හා මානසික සංවර්ධනය වෙනුවෙන් - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවෙන් - විශ්ව සම්භාව්‍ය සිනමා දැක්මක්

රාජ්‍ය ප්‍රතිපත්ති අනුව, දියුණු සංස්කෘතික මිනිසකු බිහි කිරීම සහ සිනමාව සමාජ විද්‍යාත්මකව කියවමින් පොලිස් හා ත්‍රිවිධ හමුදා නිලධාරීන්ගේ දැනුම , අධ්‍යාපනය සහ රසවින්දනය දියුණු කිරීමේ අරමුණින් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව පොලිස් මාධ්‍ය කොට්ඨාසය, ත්‍රිවිධ හමුදා මාධ්‍ය අංශ සමග ඒකාබද්ධව මසකට වරක් සංවිධානය කරනු ලබන විශ්ව සම්භාව්‍ය සිනමා දැක්ම සහ සිනමා කතිකා වැඩසටහන යටතේ අරුන් කුමාර් අධ්‍යක්ෂණය කළ Chithha ඉන්දියානු (හින්දි) සිනමා කෘතිය 2024.08.29 දින ප.ව. 1.00 ට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරයේදී ප්‍රදර්ශනය කෙරේ.

මෙහිදී නීතිගරුක, යුක්තිගරුක පොලිස් සේවාවක් වෙනුවෙන් පොලිස් නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනයට බලපානු ලබන අපරාධ නීතිය, මානව හිමිකම්, සමාජ අපරාධ, සිවිල් නීති යටතේ සමාජ දැනුමක් ලබාගත හැකි විශ්ව සම්භාවනාවට පත් සිනමා කෘති ප්‍රදර්ශනය කරන අතර මෙමගින් සිනමාව සමාජ විද්‍යාත්මකව කියවමින් විචාරාත්මක දැනුමක් පොළිස් නිළධාරින් වෙත ලබා දීම මෙහි අරමුණ බව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව පවසයි.

ලිංගික අපයෝජනයට ලක්වූ කුඩා දැරියකගේ මානසික මට්ටම , නීතිය ඉදිරියේ යුක්තිය ඉටු කර ගැනීමට දරන වෙහෙස,ඩිජිටල් මාධ්‍ය තුලින් ළමයෙකුට කරන අයහපත් බලපෑම හා එහි ඇති අනාරක්ෂිත බව,වැඩිහිටියන් දරුවන් කෙරෙහි ඇති අවධානය අඩු වීම යනාදී සමාජ ප්‍රස්තුතයන් නිරූපණය කරන, **"Chithha"** චිත්‍රපටය පිළිබඳ විචාර දේශනය රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ සහකාර ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ආචාර්ය හර්ෂ .බී අබේකෝන් මහතා විසින් පවත්වනු ලබන අතර, නියෝජ්‍ය පොලිස්පති නීතිඥ නිහාල් තල්දූව මහතා ඇතුළු පොලිස් හා ත්‍රිවිධ හමුදා නිලධාරීන් 300කට ආසන්න පිරිසක් මෙම චිත්‍රපට ප්‍රදර්ශනය සඳහා එක්වන බව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ජනමාධ්‍ය පර්යේෂණ අංශය පවසයි.

ජනමාධ්‍ය පර්යේෂණ අංශය,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව.
2024/08/23